**රුහුණ විශ්වවිද්‍යාලයය**

ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි - 2019-2020 අධ්‍යයන වර්ෂය

දෙවන සමාසික අවසාන පරීක්ෂණය 2021 නොවැම්බර්

# MAE 5203- ලෝක ආර්ථික ප්‍රවණතා

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්තය.

එක් කොටසකින් ප්‍රශ්න දෙක (2) බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට (4) පමණක් පිළිතුරු සපයන්න

## අ කොටස

1. පහත සපයා ඇති වගුව අංක 01න් විස්තර වන්නේ ගෝලීය විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහයන්, කලාපීය වශයෙන් සංචලනය වී ඇති ආකාරයයි. එම සංඛ්‍යා දත්ත සහ ඔබ දන්නා අමතර තොරතුරුද උපයෝගී කොට ගනිමින් ගෝලීය විදේශීය සෘජු ආයෝජන ගලනයේ මෑතකාලීන ප්‍රවණතා සහේතුකව සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

**වගුව අංක 01, ගෝලීය සෘජු ආයෝජන (කලාපීය) ගලනයේ මෑතකාලීන ප්‍රවණතා 2015-2020 (ලෝක ආයෝජනයේ % ලෙස)**

| කලාපය | ගලා ඒම් inflow | | | | | | ගලා යාම් outflow | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
| 1. ලෝකය (බිලියන $) | 1774 | 1746 | 1700 | 1495 | 1540 | 998 | 1694 | 1452 | 1601 | 986 | 1314 | 740 |
| 2. සංවර්ධිත ආර්ථිකයන් | 55.5 | 59.1 | **55.9** | **50.9** | **52.0** | **31.3** | **73.6** | **71.9** | **68.4** | **54.1** | **69.8** | 46.9 |
| 2.1 යුරෝපය | 31.9 | 30.5 | 33.5 | 24.3 | 27.9 | 7.2 | 41.8 | 35.4 | 33.7 | 42.5 | 36.1 | 10.0 |
| 2.2 උතුරු ඇමෙරිකාව | 22.0 | 24.3 | 17.9 | 19,9 | 19.3 | 18.0 | 23.2 | 25.2 | 23.7 | -4.1 | 15.3 | 19.0 |
| 3 සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | **42.4** | **37.0** | **41.2** | **46.8** | **44.5** | **66.4** | **24.4** | **26.4** | **29.2** | **42.0** | **28.4** | **52.3** |
| 3.1 අප්‍රිකා | **3.5** | **3.4** | **2.4** | **3.4** | **2.9** | **4.0** | **1.1** | **1.3** | **0.8** | **0.8** | **0.4** | **0.2** |
| 3.2 ආසියා | **29.5** | **26.3** | **29.5** | **33.3** | **30.8** | **53.6** | **21.2** | **25.0** | **26.0** | **41.2** | **24.9** | **52.5** |
| 3.2.1නැගනහිර සහ අග්නිදිග ආසියාව | 25.0 | 20.7 | 24.8 | 27.8 | 25.2 | 50.0 | 18.4 | 22.5 | 26.9 | 34.9 | 21.3 | 48.1 |
| 3.2.2.දකුණු ආසියාව | 2.9 | 3.1 | 3.0 | 3.5 | 3.7 | 0.07 | 0.5 | 0.4 | 0.7 | 1.2 | 0.9 | 0.1 |
| 3.2.3. බටහිර ආසියාව | 1.6 | 1.6 | 1.6 | 2.0 | 2.9 | 4.0 | 1.1 | 1.3 | 0.8 | 0.8 | 0.4 | 0.2 |
| 4 ලතින් අමෙරිකාව සහ කැරිබීම් | **9.3** | **8.1** | **9.2** | **10.0** | **10.7** | **8.8** | **2.0** | **0.1** | **2.4** | **0.01** | **3.2** | **-0.5** |
| 5. පරිවර්තීය රාජ්‍යයන් | **2.1** | **3.9** | **2.9** | **2.3** | **3.6** | **2.4** | **2.0** | **1.7** | **2.4** | **3.8** | **1.8** | **0.8** |
| 6. දිළිඳු රටවල් | **3.6** | **3.3** | **2.4** | **2.6** | **2.5** | **2.4** | **0.9** | **0.7** | **0.4** | **0.2** | **0.03** | - |
| 6.1අඩු දියුණු | 2.5 | 2.2 | 1.2 | 1.5 | 1.4 | 1.5 | 0.6 | 0.8 | 0.1 | 0.1 | -0.04 | - |
| 6.2.අභ්‍යන්තර රටවල් | 1.4 | 1.4 | 1,5 | 1.5 | 1.4 | 1.5 | 0.3 | 0.1 | 0.2 | 0.1 | 0.04 | - |
| 6.3. කුඩා දූපත් | 0.4 | 0.2 | 0.2 | 0.2 | 0.3 | 0.3 | 0.04 | 0.01 | 0.02 | 0.04 | 0.1 | - |
| Source: UNCTAD (2020). World Investment Report. | | | | | | | | | | | | |

2. i. ගෙවුම් ශේෂය පිළිබඳ මූල්‍යවාදී ප්‍රවේශයෙහි න්‍යායාත්මක තර්කනය පැහැදිලි කොට එමගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ස්ථායීකරණ ප්‍රතිපත්තිය හා බැඳී පවතින ණය කොන්දේසි සාකච්ඡා කරන්න.

(ලකුණු 7)

ii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි යෝජිත ණය කොන්දේසි ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින කුඩා ආර්ථිකයන්ට ගැලපුම් කිරීමට ඇති හැකියාවන් සහ සීමාකම් සාකච්ඡා කරන්න.

(ලකුණු 8)

3. පහත සඳහන් ඕනෑම දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. හරිත වර්ණ ක්ෂේත්‍ර විදේශ සෘජු ආයෝජන සහ දුඹුරු වර්ණ ක්ෂේත්‍ර විදේශීය සෘජු ආයෝජන
ii. කේන්ද්‍රීය පරිවාර සංකල්පය හා නව යටත් විජිතවාදය
iii. චීනයේ එක් තීරයක් එක් මාවතක් ප්‍රාරම්භය වැඩ සටහන සහ කොළඹ වරාය නගරය
iv. ගැට් (GATT) සහ ලෝක වෙළෙඳ සංවිධානය (WTO)
v. BRICS සහ NICs
vi. ගෝලීයකරණය සහ එහි ගාමක බලවේග

(එක් කොටසකට ලකුණු 08 බැගින් උපරිම ලකුණු 15)

## ආ කොටස

4. උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම කෙටියෙන් හඳුන්වා එක්සත් ජනපදය සමඟ ශ්‍රී ලංකා වෙළඳ සබඳතා කෙරෙහි එහි බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

5. i. ගෝලීය ණය උපණතියේ විශේෂ ලක්ෂණ ඔබ හඳුනා ගන්නේ කෙසේද?

(ලකුණු 5)

ii. නැගී එන වෙළඳපල ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් (EMDEs) සඳහා ණය ලබා ගැනීමේ වාසි සහ අවාසි මොනවාද?

(ලකුණු 10)

6. i. ගෝලීය පාරිසරික සෞඛ්‍යයට බලපාන ප්‍රධාන සාධක මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 8)

ii. ගෝලීය පාරිසරික අභියෝගවලට මුහුණ දීම සඳහා ගත යුතු උපාය මාර්ග මොනවාද?

(ලකුණු 7)

@@@@@@@